Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදනය

2022 අගෝස්තු 29, කොළඹ

# නෙස්ලේ නෙස්ටොමෝල්ට් ශ්‍රී ලංකාවේ වෘත්තීය පාපැදි ධාවනය බලගන්වයි

දිවයින පුරා විසිරුණු පාපැදි ධාවකයින් 400කට අධික සංඛ්‍යාවකගේ අවධානය බලගැන්වූ 2022 නෙස්ටොමෝල්ට් වට පාපැදි තරගාවලිය පසුගිය ඉරිදා (28) සාර්ථකව නිමාවට පත්විය. යෞවන කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය අඛණ්ඩව දෙවැනි වරටත් සංවිධානය කළ මෙම තරගාවලියට මෙවරත්, නෙස්ලේ නෙස්ටොමෝල්ට් සාදර අනුග්‍රහය දැක්විය.

"නෙස්ලේ නෙස්ටොමෝල්ට්, දශක ගණනාවක් පුරා ශ්‍රී ලාංකේය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශක්තිය සහ සිහින 100%ක් සූදානම් වීමට දායක වී තිබෙනවා. අරමුණු බලගැන්වීමේ අපගේ සන්නාම අභිලාෂය අනුව යමින්, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය සමඟ නැවත වරක් අත්වැල් බැඳගැනීමට හැකිවීම අපට විශාල සතුටක්. ඒ හරහා අපේ රටේ සිටින දක්ෂ පාපැදි ධාවකයින්ට සිය කුසලතා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් නිර්මාණය කරදීමටත්, ඔවුන්ගේ වෘත්තීමය පාපැදි ධාවන කටයුතු වේගවත් කිරීමටත් හැකියාව ලැබෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු", යනුවෙන් නෙස්ලේ උප සභාපති (කිරි ආහාර අංශය) රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් අඩපණ වුණු මෙරට ක්‍රීඩා කටයුතු සඳහා, ඉකුත් වසරේදී මුල් වරට සංවිධානය කෙරුණු නෙස්ටොමෝල්ට් පාපැදි අභියෝගතාව මගින් නව ජීවයක් ලැබුණි. එහි සාර්ථකත්වයත් සමඟින් මෙම තරගාවලිය වාර්ෂිකව සංවිධානය කරමින් ශ්‍රී ලංකාවේ වෘත්තීය පාපැදි ධාවනය තවදුරටත් ශක්තිමත් කිරීමට සංවිධායකයෝ තීරණය කළහ.

මෙවර තරගාවලියට අදාළ පාපැදි ධාවන ඉසව් 7 කොළඹ විහාරමහාදේවී උද්‍යාන පරිශ්‍රයේදී පැවැත්වුණේ උද්‍යෝගිමත් නරඹන්නන් රැසකගේ ද සහභාගීත්වයෙනි.

ප්‍රතිඵල :

සාමාන්‍ය පිරිමි විවෘත තරගය (ස්ටෑන්ඩර්ඩ්) –

(1) H.K.N.L. වන්ශප්‍රිය, 58:45, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
(2) ඩිල්ශාන් විජිත කුමාර, 58:45, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
(3) චාමර මධුෂාන් , 58:45, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

කණිෂ්ඨ පිරිමි තරගය (රේසිං) –

(1) L. දෙශාන් කවින්ද, 44:11, Fun Bee Cycling Club
(2) W.H.A. සචින් උමේෂ් , 44:11 Kadirana Speed Cycling Club
(3) ජවින්ද ඩිල්ශාන් 44:11, බොරලැස්ගමුව Cycling Club

සුපිරි කාන්තා තරගය (රේසිං) –

(1) මදුමාලි ප්‍රනාන්දු, 51:29, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

(2) ඈන් ෂෙනාලි, 51:29, ශ්‍රී ලංකා නාවික හමුදාව
(3) සුලෝචනා පාංචාලි, 51:30, ශ්‍රී ලංකා ගුවන් හමුදාව

වයස අවුරුදු 23න් පහළ පිරිමි තරගය (රේසිං) –
(1) ෂෙහාල් චමෙඩ් ද සිල්වා , 56:12, ශ්‍රී ලංකා වරාය අධිකාරිය
(2) A.P.D. සාරංග පෙරේරා , 56:12, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
(3) K.T. කොස්ගොඩගේ , 56:27, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

සුපිරි පිරිමි තරගය (රේසිං) –
(1) අවිෂ්ක මෙදෝන්සා , 1:06:03, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
(2) H.W.M. සඳරුවන් පින්තු , 1:06:03, ශ්‍රී ලංකා යුද හමුදාව
(3) ප්‍රභාෂ් මදුසංක , 1:06:03, ශ්‍රී ලංකා නාවික හමුදාව

වයස අවුරුදු 40ට ඉහළ පිරිමි තරගය (රේසිං) –
(1) L. සුසාන්ත් සිල්වා , 47:28, Super Sprint
(2) A. ගීතකාන්ත ද සිල්වා , 47:28, Super Sprint
(3) සුබාෂ් මංජුල , 47:28, කෙලණි Cycling Club

වයස අවුරුදු 50ට ඉහළ පිරිමි තරගය (රේසිං) –
(1) ප්‍රසන්න මෙදෝන්සා, 45:12
(2) W. රෝහිත, 45:12
(3) H. එරික් ඉරාන්, 45:22, කෙලණි Cycling Club

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. මෙරට වෙළෙඳපොළේ පවතින නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි අති නවීන නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කෙරෙන අතර, ඒ හරහා මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට ද සමාගම විශාල දායකත්වයක් සපයයි. නෙස්ලේ සමාගමේ ප්‍රමුඛතම සන්නාමයක් වන නෙස්ටොමෝල්ට් යනු වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය සහ ආදරය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටොමෝල්ට්, ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරයක් වන අතර, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, විටමින් සහ ඛනිජ ලවණ වලින් සරු කර ඇති අතර ඔබේ ගතට සිතට බලය ජවය ශක්තිය ලබාදෙයි.

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |